කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

කලා පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) -2016

(දෙවන සෙමෙස්තර අවසාන)

**ECN 2213 :- මූල්‍යනය හැඳින්වීම**

කාලය - පැය 02 යි

**ඕනෑම ප්‍රශ්න (03) කට පමණක් පිළිතුරු සපයන්න.**

---

01)

(අ) මුදල් සහ ආසන්න මුදල් යන්න නිර්වචනය කර, මුදලේ ප්‍රාථමික සහ ද්විතීක කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු10)

(ආ)"වර්තමානයේ මුදලේ ස්වභාවය විවිධ ස්වරූපයන්ට වෙනස් වෙමින් පවතී."මෙම ප්‍රකාශනය විවේචනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු10)

02)

(අ) මුදල් ප්‍රමාණවාදී න්‍යායෙහි තර්කනය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ආ) සම්භාව්‍ය මුදල් ඉල්ලුම් න්‍යාය, කේන්සියානු ද්‍රවශීලතාවරණ න්‍යායෙන් වෙනස් වනආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ඇ) ෆ්‍රීඩ්මන්ගේ සහ මුදල් ප්‍රමාණවාදය යන න්‍යායන් දෙකින්ම එකම නිගමනයකට පැමිණෙනවා ය යන කාරණය සමග ඔබ එකඟ වෙනවාද ? (ලකුණු 07)

03)

(අ) ආර්ථිකයක යහපත් පැවැත්මක් සඳහා මූල්‍ය වෙළඳපොල වැදගත් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) මූල්‍ය වෙළඳපොල සංයුතිය සහ ඒවායෙහි භාවිත වන මූල්‍ය උපකරණ සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(04)

(අ) යම් ආර්ථිකයක පොලී අනුපාතය ඉහල යන අවස්ථාවක දී පාරිභෝගිකයින් හා ව්‍යාපාරිකයින් සිය ආර්ථික හැසිරීම වෙනස් කරන ආකාරය සැකෙවින්දක්වන්න.

(ලකුණු 06)

(ආ) නාමික සහ මූර්ත පොලී අනුපාත අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඇ)"මූර්ත පොලී අනුපාතය ඉහල විට, මුදල් ණයට ගැනීම සඳහා පෙළඹවීම මුදල් ණයට දීමට ඇති පෙළඹවීමට වඩා ඉහළය" ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(05)

(අ) ඔබ අධ්‍යනය කර ඇති ණය වෙළඳපොල ප්‍රධාන උපකරණ සහ ඒවායේ ප්‍රතිලාභ පරිණත කාලය අනුව වෙනස් වන ආකාරය සැකෙවින් දක්වන්න.

(ලකුණු 10)

(ආ) මූල්‍ය උපදේශකවරයකු විසින් පහත සඳහන් ප්‍රකාශය කරන ලදී. " පවතින පොලී අනුපාතය 20% කට වඩා ඉහල අගයක් ගැනීම නිසා දිගු කාලීන බැඳුම්කර ලාභදායි ආයෝජනයක් වේ." ඔබ මෙම ප්‍රකාශනය සමග එකඟ වන්නේ ද ? පිළිතුර තර්කානුකූලව පැහැදිලි කරන්න. (ලකුණු 10)

06) පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම හතරක් (04) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) මුදල් වෙළඳපොල

(ආ) ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන වර්ගීකරණය

(ඇ) ප්‍රාග්ධන වෙළඳපොල

(ඈ ) බැඳුම්කර මිල සහ පොලී අනුපාතය අතර සම්බන්ධය.

(ඊ ) මූල්‍ය අතරමැදිකරණය

(උ) මූල්‍ය ආයතන ඒකාබද්ධ වීමේ වාසි සහ අවාසි

******************